FHSS eRepository
of Humanities and Social Sciences

Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

# මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විද්‍යුත් ප්‍රකාශන සංහිතාව (E - Repository)

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## ප්‍රකාශන පරිත්‍යාග කිරීමේ පත්‍රිකාව

කරුණාකර ඔබගේ ප්‍රකාශණය පිළිබඳ පහත තොරතුරු සපයන්න (ඔබගේ ප්‍රකාශන එකකට වඩා වැඩි ප්‍රමාණයක් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විද්‍යුත් ප්‍රකාශන සංහිතාව වෙත ප්‍රදානය කරන්නේ නම්, එක් ප්‍රකාශනයක් සඳහා එක් කර්තෘ එකඟතා පත්‍රිකාවක් බැගින් සම්පූර්ණ කිරීමට කාරුණික වන්න).

1. ග්‍රන්ථ නාමය/මාතෘකාව : සඳ හිරු නිසලයි
2. කර්තෘ ගේ නම 1 : අංජලී චන්ද්‍රිමා සිල්වා
3. කර්තෘ ගේ නම 2 : ....................
4. කර්තෘ ගේ නම 3 : ....................
5. කර්තෘ ගේ නම 4 : ....................
6. ප්‍රකාශකයා ගේ නම : කතෘ ප්‍රකාශනයකි
7. ප්‍රකාශයට පත් වර්ෂය : 2001
8. ISBN /ISSN අංකය (ඇත් නම්) : 955 - 97333 - 0 - 3
9. විකල්ප ප්‍රවේශ අවස්ථාව (ඉල්ලීම් ලිපියේ දක්වා ඇති 1 සිට 6 දක්වා වන විකල්ප ප්‍රවේශ අවස්ථාවන්ගෙන් ඔබ තෝරාගත් විකල්පයේ අංකය සඳහන් කරන්න) : ☐

   * ඔබ 3 හෝ 4 වන විකල්පය තෝරා ඇත්නම්, අවසරය ලබා දෙන පිටු ගණන සඳහන් කරන්න.: ☐
10. ඔබගේ ප්‍රකාශනය අප වෙත ලබා දෙන ස්වරූපය (පහත එක් විකල්පක් තෝරන්න):
    a. ප්‍රකාශනයේ PDF පිටපතක් ලබා දෙමි : ☐
    b. මුල් ප්‍රකාශනයේ දෘඩ පිටපතක් (hard copy) ලබා දෙමි : ☑
    c. වෙනත් (කරුණාකර සඳහන් කරන්න) .............................. : ☐

**කර්තෘ/ප්‍රකාශන හිමිකරු ගේ ප්‍රකාශය**

කොඩිකාර අංජලී චන්ද්‍රිමා සිල්වා (ඔබගේ නම/නම්) වන මම/~~අපි~~, කර්තෘ/ප්‍රකාශන හිමිකරු(වන්) වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විද්‍යුත් ප්‍රකාශන සංහිතාව (E - Repository) ට ඇතුලත් කිරීම සඳහා ඉහත ප්‍රකාශනය ලබා දීමට කැමැත්තෙමි/කැමැත්තෙමු. එසේම, එම ප්‍රකාශනය මා/~~අප~~ විසින් ඉහතින් ලබා දී ඇති විකල්ප ප්‍රවේශ අවස්ථාව මඟින් පනවන ලද සීමාවන් වලට යටත්ව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ප්‍රජාව වෙත ප්‍රවේශ හැකියාව ලබා දීමට ද එකඟ වන්නෙමු.

කර්තෘ/ප්‍රකාශන හිමිකරු(වන්) ගේ අත්සන/අත්සන්: 1) .................... 2) .................... 3) ....................

දිනය: 06/08/2024

# සඳ හිරු නිසලයි

අංජලී චන්දිමා සිල්වා



අංජලී චන්දිමා සිල්වා, මව් සෙනෙහසින් "මතු සසරෙත් ඔබේ සෙවන සුවයකි මට අම්මේ" යයි පවසයි. පිය සෙනෙහසින් "පවසට පැන් බිඳ වී ළඟ ඉන්නම්" යයි පවසයි. "ඔබ නැතිව විඳින දුකට වඩා දුකක් නැහැ ලොවේ" යයි සාංකාවෙන් වියෝ ගී ගයයි. "මිහිකත වැනි නිසල ගුණය වැනිය හැකි නොවේ" යයි ගුරු ගුණ ගයයි. බුදු සරණ පතා "සඳ කැල්මෙන් මග සොයා පැමිණියෙමි" යයි පවසයි.

මෙවැනි විවිධ වූ හැඟීම් මවන ගී රචනා හතළිස් පහක් ඇතුළත් වන ඇයගේ "සඳ හිරු නිසලයි" ගී පද සරණිය ඇය තුළ ඇති කවිත්වය එළි දක්වන්නකි. අද ජනප්‍රිය කලාංගයක් බවට පත් වී ඇති ගීත රචනය, හොඳින් බස හසුරුවමින් නියැලිය යුතු වූ සාහිත්‍යාංගයකි. අංජලී චන්දිමා සිල්වා තුළ එවන් හැකියාවක් ඇති බව පෙනී යයි.


ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිංහල පිළිබඳ ගෞරව උපාධිධාරිණියක වන ඇය, එහිම ලේඛකත්ව හා සන්නිවේදන පශ්චාද් උපාධි ඩිප්ලෝමාධාරිණියක් ද වන්නීය. ඇය බටහිර සංගීතය මෙන්ම පෙරදිග සංගීතය ද හදාරා ඇති වාද්‍ය ශිල්පිනියකි. භාෂාව පිළිබඳ දැනුමත්, සංගීතය පිළිබඳ දැනුමත්, ගීත රචනය කෙරෙහි ඇය තුළ ඇති දක්ෂතාවන් ඔප් නංවාලන බව නිසැකය.

මහාචාර්ය ජේ.බී. දිසානායක

GODAGE BOOK EMPORIUM
9559733303
SADA HIRU NISALAI
Rs. 100.00

ISBN: [illegible]
මිළ රු :100/=

සඳකඩ ප්‍රකාශන
51/7/1, රාජාහේවාවිතාරණ පාර, රාජගිරිය. දුක: 01-885161/074-410553



# සඳ හිරු නිසලයි

## ගී පද සරණිය

අංජලි චන්දිමා සිල්වා

සඳ හිරු නිසලයි

(ගී පද සරණිය)

© අංජලී චන්දිමා සිල්වා

පළමු මුද්‍රණය -2001 මැයි

සියලු හිමිකම් කර්තෘ සතු ය.

**ISBN-** 955-97333-0-3

කර්තෘ ප්‍රකාශනයකි.

පරිගණක අකුරු හා පිටු සැකසුම : ඒ.කේ.රෝජාන්
කවර නිර්මාණය : එම්. සෆීර්
කර්තෘගේ ඡායාරූපය : තිලක් පෙරේරා

මුද්‍රණය : සඳකඩ ප්‍රචාරණ හා ප්‍රකාශන
51/7/1, රාජා හේවාවිතාරණ පාර, රාජගිරිය.
දු.ක. 885161 / 074-410553

# අඤ්ජලී

**ආදරණීය අම්මාට................**
**තාත්තාට............**

දිරිය සවිබල ලැබදෙන
මව්පියන් පා වඳිමින
මේ ගත තඹුරු කරමින
තබම් පා මුල බැතියෙන

**දයාබර ගුරුමෑණිවරුන්ට.........**
**පියවරුන්ට..........**

ඔබ දුන් සිල්ප අපමණ
තුටින් සිහිපත් කරමින
පාමුල සිරස හොවමින
පුදම් මේ ගත අදරින

# පෙරවදන

දඹදෙණි සාහිත්‍ය යුගයෙහි විරචිත "පෙදෙහි රස හව් විඳුනා- දෙනෙතා ඉතා දුලබෝ" යන කව් සිළුමිණි පද්‍ය පාඨය, අන් කවරදාටත් වඩා යෝග්‍ය වන්නේ අදට යැයි කිව හැකි ය. අද කවි කියවන පාඨක සංඛ්‍යාව එතරම් මැ අල්ප බැවිනි. එහෙත් පුදුමයකට මෙන් කවියෝ නම් බොහෝ වෙත්. ගීතය නම් වූ කලා මාධ්‍යය නිසා කවිය මෙසේ යටපත් විණැයි ඇතැමුන් පැවසුවද ගීත අසන ශ්‍රාවක පිරිස මිස ගීත කියවන පාඨක පිරිස නම් ඉතා අල්ප ය. ගීයෙහි රස විඳින සවන් මිස රස විඳින දෙනෙත් නම් ඉතා දුලබ ය. එහෙත් පොත් පළ කරනු රිසි ගීත රචකයෝ ද බොහෝ වෙත්.

රසික ප්‍රතිචාර අහිමි වන මේ බොහෝ කවි ගී රචකයන් අතර ප්‍රතිභාසම්පන්න යෞවන යෞවනියන් ද සිටීම කනගාටුවට කරුණකි.

අංජලී චන්දිමා සිල්වා කලක් තිස්සේ පුවත්පත්වලට කවි ගී රචනා කරන කිවිඳියකි. ඇයගේ බොහෝ කවි ගීවලට විෂය වී ඇත්තේ ප්‍රේමය යි. ප්‍රේම සම්ප්‍රයෝගයෙහි චමත්කාරය ද ප්‍රේම විප්‍රයෝගයෙහි වේදනාව ද ඇය විසින් වර්ණිත යි. කවි ගී රචනයේ දී භාෂා භාවිතය සම්බන්ධයෙන් ඇය දක්වන සැලකිල්ල ප්‍රශංසාත්මක ය. කවිය හෝ ගීය යනු භාෂා පෙළහරක් බව අමුතුවෙන් කිව මනා නොවේ. අංජලීගේ කවි ගී ද අනුප්‍රාණය ලබන්නේ ඇයගේ කාව්‍යානුභූතින්ට වඩා ඇය වෙසෙසින් සැලකිලිමත් වන කාව්‍ය භාෂාව නිසා යැයි කිව හැකිය.

අංජලීගේ ගීය කෙරෙහි ගී රසිකයන්ගේ අවධානය යොමු වේවා යි ඉත සිතින් පතමි.

මහාචාර්ය සුනිල් ආරියරත්න

2001.03.01

# උපකාරානුස්මෘති

මා ගීත රචකාවියක ලෙස හඳුන්වා දෙන්නට මම කිසිවිටෙකත් උත්සාහ නොගනිමි. මන්ද, ගීත රචනා ලොවේ මහා වෘක්ෂ අතර මා කුඩා තණපතක් වන බැවිනි. එහෙත් මවිසින් මෙතෙක් ලියන ලද ගීත සියල්ල එක්කොට පොතක් ලෙස එළිදක්වන්නට මා තුළ වූ බලවත් ආසාව නිසා ම "සඳ හිරු නිසලයි" ගී පද සරණිය මෙලෙස බිහි වූ බව කිව යුතු ය.

මා උසස් පෙළ සමත් ව සරසවියට පිවිසෙන විට ගීතයත් කවියත් අතර ඇති වෙනස පිළිබඳ පැහැදිලි අවබෝධයක් මා තුළ නොවී ය. මා ලියන්නේ කවි යැ යි එතෙක් මා සිතා සිටියත් මහාචාර්ය සුනිල් ආරියරත්න ඇදුරුතුමන් හමුවීමත් සමග ඒ අදහසින් බැහැර වන්නට මට සිදු විය. මවිසින් පබඳින ලද සියල්ල කවියට වඩා ළංවන්නේ ගීතයට බව මුල්වරට මට පසක් කොට දුන්නේ එතුමා යි. ගීතයත් කවියත් අතර ඇති වෙනස වටහා ගන්නට එකල මා උත්සාහ දැරුවත් ඒ පිළිබඳ ව යම් තරමක හෝ අවබෝධයක් මට ලබාගත හැකි වූයේ ඉනුත් වසර කීපයකට පසු ලේඛකත්ව හා සන්නිවේදන පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමෙන් අනතුරු ව යි. එදා මෙදා තුර ගීත රචනා ලොවේ වල්මත් නොවී මේ සා දිගු ගමනක් එන්නට මට මග හෙළි කළ මහාචාර්ය සුනිල් ආරියරත්න ගුරු පියාණන්ට ඒ සම්බන්ධයෙන් කෘතවේදී වන අතර, දැඩි අවිවේකී බව හමුවේත් මෙම කර්තව්‍යයෙහි ලා ආරම්භයේ පටන් ම දැක්වූ සහයෝගය පිළිබඳ ව මගේ භක්ත්‍යාදරපූර්වක ප්‍රණාමය එතුමාට පුද කරමි.

මා මෙතෙක් ආ කටුක දුර්ග මාර්ගයේ දී මට හමු වූ මෙබඳු බෝසත් ගුණෝපේත උතුමෝ තවත් වෙති. ඔවුහු ද එතුමා මෙන් ම මගේ දුබල සවියට වාරුවක් වූහ; වියළි හද වාලුකාවට සිරිපොද වැස්සක් වූහ. මා වැටෙන හැමවිටම මට නැගිටින්නට අතදුන් ඔවුහු මගේ ගමනට අත්වැලක් වී මගේ උකටලී සිතට දිරිය කැවූහ. දුරු කතර ගෙවා ආ මේ දුෂ්කර ගමනේ කෙළවර, ලත් මඳ ඉසිඹුවේ, සැනසුම් සිතින් මා පසක් කළ එක් සත්‍යයක් නම් මෙලොව තවමත් යහපත් මිනිසුන්ගෙන් තොර නුවූ බව යි.

පාර්වතී නාගසුන්දරම්, සමන් චන්ද්‍ර රණසිංහ, ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර, දිනලි ප්‍රනාන්දු, ඉන්දිරා මාවැල්ල, මහාචාර්ය වෝල්ටර් මාරසිංහ, මහාචාර්ය ජේ.බී. දිසානායක, කමලා විජේරත්න යන ගුරු මෑණිවරුන්, පියවරුන් සහ ලිෂාන්ති විජේවර්ධන, ජයලතා මැදවත්ත, මධුභාෂිණී රත්නායක, ප්‍රදීප් රත්නායක, මනෝරි මනම්පේරි, ෂමාරා රත්සිරිනි, කුසුමලතා ලංකාමුල්ල, සන්ධ්‍යා අතාවුද යන සුහද සුහදිනීන්-

මගේ ගමනේ අත්වැල යි "සඳ හිරු නිසලයි" ගී පද සරණිය

බිහි වූයේ මිහිපිට වෙසෙනා දෙව්වරුන් බඳු වූ මෙවැනි මිනිසුන් නිසාවෙනි. ඔවුන් වෙනුවෙන් මගේ කෘතවේදී ප්‍රණාමය පුද කරමි.

ගල්මුල්වල හැපෙමින් වැටෙමින් දැනුම සොයා මා පිය නැගූ අඳුරු මාවතේ ආලෝක වළල්ලක් ව හිඳිමින් මට යන්නට ඉදිරි මග හෙළි කළ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ දයාබර ගුරු පියවරුන්ට කෘතවේදීත්වය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

නිරන්තරයෙන් මා අසල සෙවනැල්ලක් ව රැඳී සිටිමින් මගේ කලා කටයුතුවලට අතහිත දෙන ආදරණීය අම්මාටත්, තාත්තාටත්, මට හැම අතින් ම සහයෝගය දක්වන දයාබර නංගීටත්, මල්ලීටත්, මනෝජ් මල්ලීටත් සෙනෙහෙ සිතින් තුති පුදමි.

මෙය තමාගේ දෙයක් සේ සලකා මනා සැකසුමකින් යුක්ත ව පොත නිම කර දීමේ කාර්යභාරය ඉටුකර දුන් සඳකඩ ආයතනයේ එම්.සමීර් සොයුරාට මගේ හදපිරි කෘතඥතාව පුද කරන අතර, අකුරු ඇමිණීමේ කාර්යය කළ රෝජාත් සොයුරියටත්, ඡායාරූපය කර දුන් තිලක් පෙරේරා සොයුරාටත් තුති පුදමි.

මේ කාර්යයේ දී මට නන් අයුරින් සහාය වූ චම්පිකා, අශෝක, සමුද්‍ර, ජයශාන්, වරුණ, බුලිත, තිළිණ, මොහාන් යන සොයුරු සොයුරියන්ටත් අයිරා, පර්ල්, කුසුම් යන යෙහෙළියන්ටත් දයාරත්න, මහින්ද, ලියනගේ, විමලරත්න, සුනිල් යන හිතෛෂීන්ටත් ස්තුතිවන්ත වෙමි.

දැනට අප අතර නැතත් මගේ ජීවිතයට ආශිර්වාදයක් වූ දයාබර හිතැත්තන් කීප දෙනෙකු මෙහි දී සිහිපත් කිරීම මගේ යුතුකමක් කොට සලකමි. මගේ ජීවිතයට පහන් ටැඹක් වූ ආදරණීය සීයා වන විශ්‍රාමලත් විදුහල්පති සාමවිනිසුරු ජී. වී. ඩබ්ලිව්. බුද්ධදාස මහතාත් සිංහල සාහිත්‍යය කෙරෙහි සුවිශේෂී ඇල්මක් මා තුළ ඇති කළ සුමනා ගලප්පත්ති මහත්මියත් පෙරදිග සංගීතය වෙත මා නැඹුරු කළ සංගීතවේදී බී. වික්ටර් පෙරේරා මහතාත් කෘතවේදී හදින් සිහිපත් කරමි.

"සදා ඔබ ළඟ රැඳෙන්නම්", "ඔබ මගේ නොවේ" යන ගීත සිය "සෙනෙහසේ කඳුළ" කැසට් පටය සඳහා ගායනා කළ ජූඩ් උඩුගම්පල සොයුරාටත් එම ගීත සත්සරින් සැරසූ තිස්සසිරි පෙරේරා සොයුරාටත් මගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

නම් වශයෙන් සඳහන් නොකළත් මේ සත් කාර්යය සඳහා දායක වූ සැමට මගේ ගෞරවාදරපූර්වක ස්තුතිය පුද කරමි.

අංජලී චන්දිමා සිල්වා

2001 මාර්තු 20 වැනිදා
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ දී ය.

## පටුන

පිටුව


| | |
|---|---|
| ජීවය යි ඔබ මගේ | 11 |
| පවන් රැල්ලක් වෙලා එන්නම් | 12 |
| යෙහෙළියක වී සොහොයුරියක වී | 13 |
| යුද්ධය | 14 |
| පැතුම | 15 |
| යොවුන් ප්‍රේමය | 16 |
| ආරාධනා | 17 |
| පැතුම් මල් පුබුදු වී | 18 |
| මතු අත්භවයෙත් ඔබේ ම වෙන්නම් | 19 |
| ඔබට හැකි නම් | 20 |
| ප්‍රේමයේ අසිරිය | 21 |
| මවකගේ උණුසුම නොලබා | 22 |
| යථාර්ථය | 23 |
| ඔබ | 24 |
| කඳුළ | 25 |
| ප්‍රාර්ථනා | 26 |
| මායාව | 27 |
| පරවුණු කුසුම | 28 |
| ඔබ නැති දා | 29 |
| ඔබේ සෙවන සුවයකි මට | 30 |
| හිරු සැඟ වී | 31 |
| සමුදීම | 32 |
| ප්‍රේමයට ඇයි මේ හැටි සරදම් | 33 |
| මගේ ලොවේ හිමිකාරයා ඔබ යි | 34 |

| | |
|---|---|
| ගුරු පියාණනි | 35 |
| ජීවිතේ නැවතුම ඔබ යි | 36 |
| පෙම් කඳුළු | 37 |
| මතක ගහ ගලාලා | 38 |
| කාට කියන්න ද මේ දුක | 39 |
| ඉගිල ගියත් සෙනෙහෙ කැදැල්ලෙන් | 40 |
| තනිකමට සමුදී | 41 |
| ප්‍රාර්ථනා ගිලිහී | 42 |
| දුරස් උණුසුම | 43 |
| ආයාචනා | 44 |
| වියෝව | 45 |
| අම්මා | 46 |
| සාංකාව | 47 |
| මිතුදම | 48 |
| පිය සෙනෙහස නිසා | 49 |
| සඳ හිරු වී ඔබ ආවා | 50 |
| සදා ඔබ ළඟ රැදෙන්නම් | 51 |
| අසුභ සිහින දකින්නී | 52 |
| ඔබ මගේ නොවේ | 53 |
| අක්කණ්ඩි | 54 |
| විරහා වේදනා | 55 |


"නිහඬතාව
හොඳම ගීය යි
හඬින් පිරි
මේ ලෝකයේ"

# ජීවය යි ඔබ මගේ

මහද උයනේ සුපිපි කුසුම යි
කිසිදු දිනයෙක මිලින නොවෙනා
සදා හැඬවෙන සත්සර යි ඔබ
මහද වෙණ තත් අතර රැඳෙනා

සදා නොසිඳෙන සෙනෙහෙ නදිය යි
පැතුම් රැළි මැද ගලා හැලෙනා
නිබඳ දල්වෙන පහන් සිළුව යි
අඳුරු හද ගැබ එළිය කරනා

මුදු සිසිල් මද පවන ඔබ ම යි
වැළඳ හද සෝ තැවුල් නිවනා
මහරු තුරු සෙවන යි සදා ඔබ
ජීවිතේ මග විඩා නිවනා

# පවන් රැල්ලක් වෙලා එන්නම්

නපුරු වදනින් තැලුණු සිත් තුළ
ඔබට සෝ දුක වෙන්න හැකි නම්
එවන් සෝ දුක් නිවන කඳුලක්
වෙලා නෙතඟින් ගිලිහී යන්නම්

දුබල උන් ගෙල සිඳින සිත්වල
ඇනෙන අවි තුඩ වෙන්න හැකි නම්
එවන් අවියට පණ පොවන්නට
ශක්තියක් වී ළඟ රැඳෙන්නම්

මලක් වී මිනිසත්කමින් පිරි
කුරිරු සිත් ළඟ පිපෙනු හැකි නම්
ඒ සුවඳ ගෙන දසත හමනට
පවන් රැල්ලක් වෙලා එන්නම්



# යෙහෙළියක වී සොයුරියක වී

පෙම් රජ දහනේ කිරුළු දරා ඔබ
ඔහු අත ගෙන යන හෙට දවසේ
හඬා වැටෙන සිත වාරු කරන් මම
ඔබහට ආසිරි පතමි මෙසේ

සොයුරු දමේ බල මහිමය මෙතෙකැ යි
ඔබෙනි උගත්තේ පෙර දවසේ
කඳුළක පහසින් නෙත දැවෙනා විට
ඔබෙ සුරතේ සුවය යි දැනුණේ

එක් වී ආ මග මා තනිකර දා
වෙන් වන්නට සමු යදින පැයේ
ඔබ ගැන මතකය හදට තුරුළු කර
සමුදෙමි එනු මැන මතු ආයේ

# යුද්ධය

පිපුණු සඳ කළු දුමෙන් වැසිලා
අඳුර රජ කරනා රැයේ
හඬා එන මරණයේ බියකරු
රුදුරු රිද්මය දෝ
මට ඇසුණේ............

බියකරු වූ ගොස නගා ඇදෙනා
යකඩ රථවල අනුහසින්
තැලී පොඩිවෙන තල් කඳන්වල
සුසුම් රාවය දෝ
මට ඇසුණේ............

බියකරු වූ අවි හඬට කන්දී
ලොව ම නිසල වූ යාමයේ
සොබාදම් මව වැලපෙනා ඒ
යශෝ රාවය දෝ
මට ඇසුණේ.............



# පැතුම

මිලාන කුසුමන් පුදසුන වැතිරී
ඔබේ පා සෙවනේ ගිමන් හරිද්දී
සඳ කැල්මෙන් මග සොයා පැමිණියෙමි
බුදු හිමියනි ඔබෙ සරණ පතා

අගිල් කපුරු දුම් සුවඳ කුසුම් නැත
බැති සිත පමණයි ගෙන ආවේ
ආශා ගින්නෙන් දැවෙනා මනු ලොව
ඔබෙන් පමණි සුවයක් පැතුවේ

දැහැන් ගත වූ ඔබෙ වත අබියස හිඳ
පෙරුම් පුරමි මුදු කුසුමක් වන්නට
මෙවන් ලොවක යළි නොලැබ මිනිස් බව
ඔබෙ සිරි පාමුල මිලාන වන්නට

# යොවුන් ප්‍රේමය

පාළු නිසංසල ගන අඳුරේ
නිදි නැති රෑ යහනේ
දිවිය දවාලන සුසුමක් පමණි ය
යොවුන් වියේ ප්‍රේමේ

ගිනිගෙන දැවෙනා ගිනි කත්රේ
පිපාසිත වූ තොල් පෙති හමුවේ
දිය බිඳුවක් පෑ මිරිඟු දැහැනකිය
යොවුන් වියේ ප්‍රේමේ

යොදුන් ගණන් දුර යන ගමනේ
විඩාබර වූ නෙතු කැන් මතුයේ
නැගෙනා උණු කඳුළැල්ලක් පමණි ය
යොවුන් වියේ ප්‍රේමේ



# ආරාධනා

මන්දාරම් අහස වගේ
කළුවර වූ හද කුටියට
අඳුර මකා එළිය ගෙනෙන
සඳක් වෙලා නැඟී එන්න

තෙරක් නොදුටු සයුරේ නැගී
සැඩ රළ වැනි වදන්වලින්
රිදුණු සිතට සිසිලස ගෙන
මඳ පවනක් වෙලා එන්න

ලොවේ නපුරුකම් විදිමින්
තනිවූ සිත ඉකිලන විට
හසරැළි දේදුන්නක විත්
සිත් වළාවෙ රැඳී ඉන්න

ජීවන මග පියවර මැන
හෙම්බත් වී හිදිනා සඳ
මුදු සිහිලැල් සෙවන සදන
ගසක් වෙලා එමග ඉන්න

## පැතුම් මල් පුබුදු වී

ඉමක් නොපෙනෙනා හිස් නුබ කුස දෙස
කඳුළු උනන තුරු නුවන් යොමා සිටි
නොසිඳෙන පැතුමක සොඳුරු වූ සිහිනය
තවදුරටත් සිහිනයක් වුණේ නෑ

සුවිසල් ගිරි හෙල් මුදුන් දෙදරවා
හමන දුක් සුසුම් සැඩ මරු හමුවේ
සිතුවිලි අචල ව දිවිය දැරූ සඳ
තව දුරටත් සිත සසල වුණේ නෑ

දෙගොඩ තලා යන කඳුළු නදී රළ
දිවියට එක්කළ දිරි සවිබල හැම
අතීතයෙන් ලද උරුමය වුණු දා
පැතූ පැතුම් මල් මිලින වුණේ නෑ



## මතු අත්භවයෙත් ඔබේ ම වෙන්නම්

දුබල ගතේ අවසන් වෙර බිඳුවත්
සැරයටියට දී ඔබ යන දවසේ
සුරතේ වාරුව ලැබ දී නිරතුරු
සැරයටියට ඔබෙ සමුදෙන්නම්

මිලාන දෙනෙතේ රැඳුණු එළිය බිඳ
අනන්තයක් වෙත විහිදී යද්දී
මා දෙනෙත් එළියෙන් ඔබෙ දෙනෙතට
ආලෝකය දී සැනසෙන්නම්

අත්වැල් බැඳ ආ ගමනේ කෙළවර
තනිව ම සමුගන්නට ඉඩ නොමදී
යළි හමුවන්නට මතු අත්භවයෙත්
සඳහට ඔබ ළඟ සැතපෙන්නම්

# ඔබට හැකි නම්

අයුක්තිය ලොව ජය ගනිද්දී
නැගී සිටිනට ඔබට හැකි නම්
සියලු සවිබල ලබාදෙමින් මම
දිරිය මව වී ළඟින් ඉන්නම්

වැටෙන අය හැම නගා සිටුවා
ඉදිරි මග හෙළි කරනු හැකි නම්
සෙනෙහසින් ඔබ ළඟ රැඳී සිටා
ශක්තියේ සෙවනැල්ල වෙන්නම්

සිහින මායා පටල බිඳ දා
පියවි දෙනෙතින් ලොව දකී නම්
ඔබේ දිවියට අත්වැලක් වී
සදා ඔබ ළඟ රැඳී ඉන්නම්



# ප්‍රේමයේ අසිරිය

සවන පිනන විහඟ ගීත
නද පරදාලා
ඔබේ මධුර හඬ රැව්දේ
සවන පිරීලා

මදනල පිස හමන කුසුම්
සුවඳ මැකීලා
ඔබේ සුවඳ දනේ හදට
සිත උතුරාලා

නිසල රැයේ අඳුර මකන
තරු කැට පරදා
දල්වෙයි ඔබෙ නෙත් මිණි
දිවි අඳුර මකාලා

## මවකගේ උණුසුම නොලබා

පාළු හුදකලා පුංචි පැල්පතේ
එළිය නුඹ යි අම්මේ
අඳුරට ගුලි වී සිත වැලපෙනවා
නුඹ ළඟ නෑ අම්මේ

කුසගිනි දැනුනත් ඉවසා ඉමි මම
වදන් ගොළු යි අම්මේ
නුඹ ළඟ සිටිදා දොඩමළු සිත් මගේ
අද නිහඬ යි අම්මේ

කඩමළු පැදුරේ උණුසුම සෙව්වත්
එය අහිමි යි අම්මේ
ලොවක් හිමි වුණත් ඔබෙ සෙනෙහස නැති
මට පල නෑ අම්මේ



## යථාර්ථය

නෙතු පියන් සලා දුක් කඳුළු ගලා
හදවත ඉරිතලලා
පැතු විමන් බිඳි හැඟුමන් වියැකී
ලොව වල්මත් වීලා

සතුට මිරිඟුවකි සැනසුම් සුවදෙන
ජීවන මරු කතරේ
හඹා ඇදී එය හඬා වැටේ සිත
නෙතු මායා අතරේ

ආලය මිහිරකි සොම්නස කැඳවන
සොඳුරු සිහින මැදුරේ
එයින් මිදී ගියදා වැලපෙන සිත
තනිවේ කඳුළු තෙරේ

## ඔබ

මා නෙතු යුග තුළ නිබඳ ව රැඳෙනා
මදහස කැල්ම ඔබ යි
ඒ නෙතු අග හිඳ ඔච්චම් කරනා
කඳුළු බිඳත් ඔබ ම යි

මා සිත පිරිමැද එය නිති කළඹන
සෙනෙහස් ගඟුල ඔබ යි
සැනෙන් වියරු වී ඒ සිත පාරන
සැඩ පහරත් ඔබ ම යි

හද සොම්නස් මල් විකසිත කරවන
අරුණළු කිරණ ඔබ යි
එමල් මිලින කර හද සෝ අවුලන
ගන අඳුරත් ඔබ ම යි



## කඳුළ

හදේ ඇවිලුණු අග්නි ජාලා
සිසිල් පිණි දිය ඉස නිවන්නට
කොපුල් තල සිඹ සනසවන්නට
ළඟින් සිටියේ ඔබ යි සැම දින

ඔබට පෙම් බැඳි සමය නිම කොට
සිනා කුමරුගෙ අත ලබන්නට
පෙරුම් පිරූ මුත් ඔබ යි හිමි මට
අහිමි හසරැළි කුමට මා හට

හිරි වැටී ගිය ආත්මය යළි
ඔබට ඇරයුම් කරයි එන්නට
විඩාබර නෙතු මග විවර කර
පිළිගනී ඔබ පෙර ගමන් කොට

## ප්‍රාර්ථනා

මගේ කඳුළු සිසිල ගෙනෙන
පිණි බිඳු වේවා ඔබහට
මගේ සුසුම් සුවය සදන
පවනක් වේවා ඔබහට

පැතුම් කුසුම් කැන් මිලින වූ
පලසක් වේවා ඔබෙ මග
හද දවනා රුදු ගිනි දැල්
වේවා දිය දහර ඔබට

හද හඬවන මිහිරි මතක
වේවා සුභ සොඳුරු සිහින
වියැකුණු නෙත් සහල මගේ
වේවා මිණි පහන ඔබට



## මායාව

ආදරය සෙනෙහස නොවේ ඔහු
නෙතේ රැඳුණේ රාගය යි
හැඟුම් මත් කළ මඳ සිනාවේ
රැඳී තිබුණේ සරදම යි

මිරිඟු කතරේ දුටුව දිය බිඳ
හදේ රැඳි මායාව ම යි
නුවන් කැළඹූ දසුන බියකරු
සත්‍ය හෙළිකළ කැඩපත යි

රැයේ දුටු සුන්දර ම සිහිනේ
දෙනෙත් අබියස බොඳ ව යයි
හදේ පැතුමන් දවා හළු කර
ශෝකයේ ගිනි දළු නැගෙයි

# පරවුණු කුසුම

ප්‍රේමයේ පුදසුනේ
පරව ගිය මල ඔබ ද ළඳුනේ
සෙනෙහසේ පැන් බිඳක්වත් නොලබා

පිවිතුරු වූ හද මල නෙලා ඔබ
කිළිටි වූ පුදසුනක තැබුවේ ඇයි
අහිමි සෙනෙහෙක සුව විඳින්න්ට
මුළු හදින් ඔබ පෙරුම් පිරුවේ ඇයි

හඬන දෙනෙතට හාදු දෙන කඳුළැල්
ඔබේ තනියට ළඟින් සිටියා දෝ
ලොවේ ගැරහුම් අසනි වර්ෂා
ඔබේ ගමනට අත්වැලක් වුණි දෝ



# ඔබ නැති දා

ඔබ නැති මගේ ලොව
රෑ ගන අඳුර වැනී
රැහි හඬන හඬ
වැලපෙන මසිත වැනී

දුක් පොදි පිරුණු හද
ගැබ්බර අහස වැනී
නෙතු උතුරන කඳුළු
සාගර ජලය වැනී

හමනා සැඩ සුළඟ
මගෙ දුක් සුසුම් වැනී
එහි රුදු සිසිල් බව
මියැදෙන මසිත වැනී

## ඔබේ සෙවන සුවයකි මට

ඔබෙ හද අරණේ
සිහිලැල් සෙවනේ
සෙනෙහස් සුව විඳිනා
මුවැත්තිය යි මා.......

වග වලසුන් පිරි ලොවෙන් මුවා වී
ඔබෙ ඉරහඳ යට ගිමන් නිවද්දී
සෙනේහයේ මුදු සුවඳ යි මට දැනුණේ
නෙත් යුග කිසිදා නෑ කඳුලක් දුටුවේ

පවිටු දනන් නෙත් හී සර පහර වැදී
හද සැලෙනා විට බියෙන් සසල වී
ඔබෙ මුදු සුරතේ සුවය යි මට දැනුණේ
දුක් සෝ සංකා නෑ හදවත පෙලුවේ



## හිරු සැඟ වී

හිරු කුමරුනි ඔබ කොහි සැඟවුණි දෝ
මා තනිකර මෙලෙසින්
මගේ ලොවට ඔබ යළි වඩිනාතුරු
වැලපෙමි වියෝ දුකින්

ඔබ නැතිදා මගේ ලෝකය අඳුරු ය
මුව සඟවා ගන්නෙමි
සෙනෙහස් කිරණින් මා නහවනු මැන
යළි විකසිත වන්නෙමි

ජීවන විල්තෙර නිසල ය සෝකෙන්
කෙලෙසක සැනසෙන්නෙමි
සිතුම් මත් බිඟුන් මුමුණයි දුක් ගී
කෙලෙසින් වාවන්නෙමි

# සමුදීම

ඔබ මා හමුවන සරසවි සෙවණින්
සමුගෙන මා යන හෙට දවසේ
මා අබියස හිඳ දෙනුවන් බොඳකර
කඳුළු සලන්නට එපා ළඳේ

ඔබට උරුම මග ඔබ යා යුතු ම ය
මගක් නොමැති මා අසරණ' වූවත්
කම් නැත සොඳුරිය පියමැන් යනු මැන
ඔබෙ මග පැහැදිලි නම්

දෙගුරුන්හට අවනත දරියක ලෙස
ඔහු අතගනු මැන මා තනි වූවත්
සෙනෙහෙ සිතින් මම ආසිරි පතමින්
ඔබහට සමුදෙන්නම්



# ප්‍රේමයට ඇයි මේ හැටි සරදම්

ඔබ දුටු සිහිනෙක සොඳුරිය වී මා
හද කුටියේ හිඳ ගිමන් නිවූව ද
සැබැවින් ඔබෙ ලොව අබිසෙස් ලැබුමට
පින් නොකළේ ඇයි දෝ........

ලොව ම එරෙහි වී මා පෙළනා සඳ
නිසල වූ සිතුවිලි අසරණ වූව ද
ඔබේ නුවන් යුග කඳුලින් බොඳකර
සමුගෙන ඔබ හැර යා හැකි දෝ.......

මා හද රිදවා තුටින් සිනාසෙන
ලෝකය හමුවේ කඳුළැල් සඟවා
වැලපෙන කඳුළක සිනා පොදක් වී
හිනැහෙන්නටවත් ඉඩ නැති දෝ.......

# මගේ ලොවේ හිමිකාරයා ඔබ යි

මගෙ ඉරහඳ සොරකම් කළ
ඔබ යහපත් සොරෙකි සබඳ
සොර සිතකින් ඒ ඉරහඳ
නොගත්තු හින්දා

අනන්ත වූ ඔබෙ හද ගැබ
ඒ ඉර හඳ සැඟ වූ දා
නෙත් තරුකැට සිනාසුණේ
ඔබ ළඟ හින්දා

මගේ ඉරහඳ ඔබ ම ගන්න
ඔබට හැකි ය එළිය දෙන්න
ඔබෙ නෙත් තුළ එය සඟවා
සුරකින හින්දා



# ගුරු පියාණෙනි..........

පහන් සිතුවිලි............
හද තුළ රැඳෙන සියුමැලි
සිතට යළි යළඑළි........
ගෙන එයි සුවය සිහිලැලි

ගුණය ඔබේ නිබඳ ව වැණුව ද නිමක් නොවේ
අගය ඔබේ කීව ද එය කියා නිම නොවේ
කුළුණු ගුණය මහමෙර වැනි සිතා නිම නොවේ
මිහිකත වැනි නිසල ගුණය වැණිය හැකි නොවේ

ඔබ දුන් ඔවදන් නිරතුරු මෙනෙහි කරන්න යි
හද සනසන මිහිරි මතක අවදි කරන්න යි
සිතේ පිපෙන බැති මල් ඔබ නමින් පුදන්න යි
අඳුර මැදින් ඔබේ ලොවේ එළිය දකින්න යි

# ජීවිතේ නැවතුම ඔබ යි

දුටුදා පටන්
ඔබ මගේ ම යෑ යි
මට දැනුණේ ඇයි
මා රිදවූවත්
හැම මොහොතක දි ම
මගේ ම යෑ යි ඔබ
සිත පවසන්නේ ඇයි

තැන තැන යන මුත් හීලෑ නැති සිත
එය ඔබෙ වරදක් නොවන බැවින්
අහිතක් නොසිතම් කිසිවිට ඔබ ගැන
සමාව ඇත ආදරේ නමින්

හද දවනා දුක කඳුලක් විලසින්
ගිලිහී වැටුණත් දෙනෙත් අගින්
සමුගෙන යන්නට සිතට ඉඩක් නැත්
දිවියේ නැවතුම ඔබ ම බැවින්



# පෙම් කඳුළු

හුදකලාව දෙතැනක තනිවීලා
ආදරේ නමින් සුසුම් හෙලා
ලොවට හොරෙන් දෙසිතක් වැලපෙනවා
ආදරේ නමින් නුවන් තෙමා

ඔබහට මා නැති මා හට ඔබ නැති
පාළු ලොවක අප තනිවීලා
බාධා වැටකොටු රැකවල් ලා ඇත
එනමුදු සිත නැත සසල වෙලා

අප යන මේ මග බාධක හමුවේ
සවි බල දෙන අත්වැල වීලා
මතුයම් දිනයක මිහිදන් වනතුරු
ඉන්නම් ඔබ ළඟ නතර වෙලා

# මතක ගඟ ගලාලා

මගේ මතක ගඟ සැණෙන් ඉවුරු බිඳ
උතුරා ගලා හැලේ
දෙගොඩ තලා යන එහි පාවෙන්නට
සිත මගෙ ලොබින් පෙළේ

සෙනෙහස මුසුවුණු මතක ගං දියේ
මසිත සැරිසරන්නේ
පැතුම් රළ මැදින් ඔබ නැගෙනා සඳ
ගං දිය කැළඹෙන්නේ

මතක ගං දියේ කිමිදි කිමිදි සිත
උණුසුම අයදින්නේ
කඳුළු ගං තෙරට ඇරයුම් කරමින්
ඔබ එහි සැඟවෙන්නේ



# කාට කියන්න ද මේ දුක

මා සිත හඬනා බව දන
සිනා වුණත් කම් නෑ ඔබ
සිත රැඳි දුක ඔබට මිසක
කාට කියන්න ද වෙන මම

ඔබ වෙනතක ගිය දිනයේ
මගෙ දුක හිතට ම මුමුණා
පුරුදු සෙනෙහසින් සිටි බව
කාට කියන්න ද වෙන මම

සීන ලොවක හැදූ විමන
පුපුරු ගසා ඉරි තැලෙද්දි
මගේ දුකට මං හැඩූ බව
කාට කියන්න ද වෙන මම

## ඉගිල ගියත් සෙනෙහෙ කැදැල්ලෙන්

වැහි ළිහිණියකු ලෙසින්
තටු ගසා ඉගිල යන්නට ඔබ
හදන හැටි හොරෙන්
බල බලා දුකිනි සිත මගෙ තටු
සිඳී ඇති බැවින්

ලැගුම් අරන් සිටියත් මගෙ
සෙනෙහෙ කැදැල්ලේ
එයින් නික්ම සැරසෙයි ඔබ
යන්න නිදැල්ලේ

ඉවත ඉගිල ගියත් නැවත
ආව ඇසිල්ලේ
පුරුදු සෙනෙහසින් සැනසෙමි
ඔබේ තුරුල්ලේ



## තනිකමට සමු දී

වැහි වළාවකින් සඳ වැසී ගියා
මහ වැස්සක පෙර නිමිති කියා
ගන අඳුර නුඹ කුසෙහි සුව සොයා
රිසි ලෙසින් වැතිරුණා කල් බලා

තනි වළාවක් අහසේ ඇදී
නෙතු සලා එළිය දුනි යළි යළී
සඳ හොරෙන් බලමින් දිලි දිලී
සෙනෙහසින් ඔහු වෙත ළංවුණී

මෙතෙක් කල් මග නොම දනී
හුදකලා වී සැරුවා ඇති
සිතු වළාකුළ සඳ වෙත බැඳී
විසුවා තුටින් ඇය හා නිතී

# ප්‍රාර්ථනා ගිලිහී

නුඹේ නමින් මා පබැඳූ
ගී පද එකිනෙක ගිලිහී
නෙත් අබියස බොඳ ව යද්දි
මට දුක සිතුණා

පෙරදා නුඹ නමින් පිදූ
මල් එකිනෙක පරවෙනු දැක
මගෙ දුක කඳුළක කැටි වී
නෙතින් ගිලිහුණා

නුඹේ මතක සුවඳ අරන්
දිවි මඟ පියවර මනින්න
පැතූ පැතුම් හද පතුලෙ ම
වියැකිලා ගියා



# දුරස් උණුසුම

රැහැනක් වී වෙලා ගන්න
බැරි හින්දා
දැහැනක් වී ළඟ ඉන්නම්
නෙතු රන්දා

පන්හිඳ වී සුරතේ ඉනු
බැරි හින්දා
ගීයක් පදවැල වෙන්නම්
සිතු බන්දා

කුසුමක් වී දෝතට එනු
බැරි හින්දා
පුදසුන වී ඉන්නම් හද
කර නන්දා

# ආයාචනා

ඔබෙ උර මඬලේ සිරස හොවාගෙන
එක ම එක වරක් හඬන්න දුන මැන
අතීතයේ ඔබ නමින් ඉතිරි වුණ
අවසන් කඳුළත් නෙතින් මුදන්නට

මරු කතරක් වන් මේ දිවි ගමනේ
කෙම්බිම වී ඔබ ගිමන් නිවූ දා
මුව නැගි හසරැල් කඳුලක කැටි වී
හිනැහෙන නෙතු පිය මත රැඳුණා

මියෙන තුරා රැකවරණය ලබමින්
ඔබෙ තුරුලේ හිඳ සිනා නගන්නට
මා මුව රැඳි හසරැල් රැක ගනු මැන
කිසිදා කඳුළක් නෙතට නොඑන්නට



# වියෝව

සෙනෙහසක් හිතේ පොදි බැඳ
මගේ හිත ළඟින් නැවතුන
නුඹේ ආදරේ අරුමය
හිතට දෑනෙනවා

මගෙන් ඈතකට ගිය මුත්
යළිත් එනු ඇතැ යි සිතමින්
දෙනෙත් රතු වෙනා තුරු මග
බලා හිඳිනවා

මුදන්නට නොහැකි සිතුවිලි
කැළඹුවත් මගේ හදවිල
සිහිනයෙන් පවා තවමත්
නුඹ ම පතනවා

# අම්මා

අඳුරු හදට එළිය අරන්
පැයූ සඳ අම්මා
දිවි කතරට සිසිල බෙදන්
වට වැහි පොද අම්මා

දිවි ගමනේ මග හෙළි කළ
තරු එළිය යි අම්මා ‟
කඳුළට සමු දී නෙත රැඳි '
හසරැල්ල යි අම්මා

මිලින පැතුම් නටු අග පිපි
නව පැතුම යි අම්මා
මතු සසරෙත් ඔබේ සෙවන
සුවයකි මට අම්මා



# සාංකාව

ඔබ නැතිව විඳින දුකට වඩා
දුකක් නැහැ ලොවේ
ඉකිලන මතක පමණි
ඉතිරි වුණේ
සිහින දනව්වේ

හුරු පුරුදු සුවඳ නැතිව මෙලෙස
ඉන්නේ කෝමා
නෙත රැඳුණු කඳුළු පවසයි
හද දවන වේදනා

නිති පහුරු ගගා පාරයි සිත
නුහුරු කල්පනා
තනිකමට ලොල් ව දවටෙයි
නිදි නොමැති චේතනා

## මිතුදම

ගැ: සමනලයෝ ඇයි නුඹ ළතැවිල්ලෙන්
කිම දෝ වුණේ කියන්

පි: පෙති හකුලාගෙන අහක බලාගෙන
මල නිසල යි සෝකෙන්

ගැ: යෙහෙළිය ඔබගේ දුක්කින් ඇයි ද යි
කොඳුරා අසනු සෙමින්

පි: ඇගේ වත මිලින ය නෙතු අග කඳුළු ය
ළංවන්නේ කෙලෙසින්

ගැ: මං සමුගන්නම් හිරුහට ඉඩ දී
මල විකසිත වෙයි නම්

පි: ඇය මෙහි තනිකර මට යා නොහැකි ය
හිරු එනතුරු ඉන්නම්



## පිය සෙනෙහස නිසා

අරුණැල්ලක් සේ පායා එන්නම්
පියාණනී මා ඔබෙ හද කුටියට
ඉඩෝරයට පොද වැස්සක් වී නිති
එන්නම් ජීවන සරතැස නිවුමට

නෙතු කඳුළට හසරැල්ලක් වීලා
ඉන්නම් ඔබගේ වියපත් නෙතු කොන
සෙනේහයේ පහනක් ලෙස දල්වී
දුරලන්නම් ඔබෙ හද රැඳි දුක'දුර

පවසට පැන් බිඳ වී ළඟ ඉන්නම්
මේ ජීවන මග පියවර තැබුමට
ගිම්හානයකට වසන්තයක් වී
එන්නම් සතුටේ මල් පුබුදන්නට

# සඳ හිරු වී ඔබ ආවා

අඳුරින් පිරුණු මගෙ දිවිය ම එකලු කරන්
ඔබ ආවා සඳ හිරු වී එළිය අරන්
පැතුමක් වෙලා හිත අද්දර නතර වුණෙන්
මගේ ජීවිතේ පැතුම ද ඔබ වීය කෙමෙන්

කඳුළැල් නෙතින් පලවා හැර සෙමෙන් සෙමෙන්
හසරැල් ළං කළා සසරේ පුරුදු ලෙසින්
ජීවන මගේ පියවර මැන විඩා හදින්
හිඳි මට සිහිල් සෙවනක් විය දයා සිතින්

අමාවකේ පෑයූ තනි තරුව ලෙසින්
තනි නොතනියට ළඟ සිටියා සැබෑ පෙමින්
අරුණෝදයේ හිරු සේ එබිකම් කරමින්
හද කුටියට ආවා ඔබ මටත් හොරෙන්



# සදා ඔබ ළඟ රැදෙන්නම්

අඳුර මකනා සඳක් වී ඔබ
මගේ දිවියට එළිය දේ නම්
සඳේ තනියට හිඳින තරුවක්
විලස මා ඔබ ළඟ රැඳෙන්නම්

වියරු සිතුවිලි රළ නැඟෙන විට
තෙරක් වී ඒ රළ බිඳී නම්
සවිය ඇති ගල් කුලක් විලසින්
සයුරු තෙර මා රැඳී ඉන්නම්

හිරු ලෙසින් මා තපුරු වන කල
ගහක් වී ඔබ සිසිල දේ නම්
සෙනෙහසේ මුදු සුළඟෙ දවටී
බැතින් ඔබෙ හද වැළඳ ගන්නම්

# අක්කණ්ඩි

හිරු බැස යන විට අවර දිගින්
බර උසුලාගෙන සිනා වතින්
පෝදා පැයූ පිරුණු සඳක් සේ
ඇය ගෙට එනවා අඳුර මැදින්

පැතුම් පිරුණු හද අගුළු දමන්
කඳුළු පිරුණු නෙතු වසන් කරන්
දිව රෑ නොබලා වෙහෙස දරයි ඇය
මා හට මං පෙත් බදිනු රිසින්

සසරේ හුරු වූ විලස නිතින්
දුක සහවා ගෙන සිනාවකින්
දිවි ගමනේ පියවර මැන යයි ඇය
වියපත් කන්‍යාවියක ලෙසින්



# විරහා වේදනා

නෙතේ කඳුළු එකතු කරන්
මං හැදූවා මාල පොටක්
ඔබේ ගෙලේ එය පළඳන්නම්
කඳුළු බිඳක රැඳුණු සිසිල
ඔබට දැනේ නම්

හදේ සුසුම් එකතු කරන්
මං හැදූවා තෝඩු දෙකක්
ඔබේ දෙකනේ එය පළඳන්නම්
හද දවනා උණුසුම එහි
ඔබට දැනේ නම්

වියොවේ ගිනිදැල් එක්කොට
මං හැදූවා නළල් පොටක්
ඔබේ නළලත එය පළඳන්නම්
විරහා ගින්නෙ රුදුරු පහස
ඔබට දැනේ නම්